**හැටන් - නුවරඑළිය මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2013**

---

හැටන් - නුවරඑළිය මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජය සහ මහජන කොරියානු ජනරජය වෙනුවෙන් කොරියානු අපනයන - ආනයන බැංකුව සමඟ 2010 නොවැම්බර් මස 02 දින එළඹි අංක එස්ආ ර්අයි - 20 දරන ණය ගිවිසුම යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---

හැටන් - නුවරඑළිය මාර්ග වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව මාර්ග සංවර්ධන අධිකාරිය (මාසං.අ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. හැටන් සිට නුවරඑළිය දක්වා වෙළඳ පොලවල් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ රැකියා අවස්ථා සැපයීම සහ සමාජ සේවා සැපයීම තුලින් දකුණු පළාතේ සමාජ ආර්ථික වර්ධනය සහ සංවර්ධන තුලනය සඳහා පෙළඹවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 5,618 ක් වූ අතර එයින් රු.මිලියන 4,501 ක් හෙවත් මුළු පිරිවැයෙන් 80 ක ප්‍රතිශතයක් මූල්‍යනය කිරීමට කොරියන් අපනයන - ආනයන බැංකුව (ඊඩීසීඑෆ්) එකඟ වී තිබුණි. කෙසේ වෙතත් මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලයන 5,685 දක්වා වැඩි කිරීමට ඊඩීසීඑෆ් බැංකුව අනුමැතිය දී තිබුණි.

ව්‍යාපෘතිය එහි කටයුතු 2011 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර ආරම්භ කිරීමෙන් පසු මාස 30 ක් ඇතුළත නිම කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී අතිරේක වැඩ හඳුනාගැනීමත් සමඟ නිම කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වෙතත්,සමාලෝචිත වර්ෂය තුළදී අතිරේක වැඩ හඳුනාගැනිමත් සමඟ නිම කිරීමේ දිනය 2015 මාර්තු මස 02 දින තෙක් දීර්ඝ කරන ලදි එහි ප්‍රතිඵලයක් වශයෙන්, මුළු පිරිවැය ඇස්තමේන්තුව ව්‍යාපෘතිය විසින් රු.මිලියන 9,061 දක්වා තවදුරටත් වැඩි කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම් වූ මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුලත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් අස්තමෙන්තු සහ මූල්‍ය

ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරික්ෂාවන් ද විගණනයට ඇතුළත් වේ.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියෙහි මෙහෙයුම් වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව;

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරණ ලද ව්‍යාපෘති වියදම මූල්‍යමය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය හා ප්‍රදානයෙන් කරන ලද මිලදී ගැනීම්, හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව;

(ඇ) ණය ගිවිසුම යටතේ ආපසු ගැනීම් නියම කරන ලද පිරිවිතරයන්ට අනුව සිදුකර තිබුණේද යන බව;

(ඈ) ණය යටතේ සපයනු ලැබූ අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව;

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදගන්නා ලද වර්ගීකරණයන්ට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව;

(ඊ) මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන පිළියෙල කර තිබුණේද යන බව;

**3. මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 05 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැටළුවලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරනා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වර්තා පවත්වා ගෙන ගොස් තිබූ බවත්, පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුව මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ කටයුතු සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව;

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව;

(ඇ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව;

(ඈ) කළමනාකරණය විසින් ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් කරුණු නිවැරදි කිරීමට සතුටුදායක පියවර ගෙන තිබෙන බව,

**4. මූල්‍ය ප්‍රකාශන**

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ පවත්නා තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.මිලියන 1,766 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.මිලියන 2,998 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශය කර පහත දැක්වේ.

| විෂය | දෙසැම්බර් 31 දිනට වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| ස්ථාවර වත්කම් | (35,596) | 146,656 | 129,585 |
| කෙරීගෙනයන වැඩ | 1,765,664,857 | 1,102,215,706 | 2,998,000,297 |
| | 1,765,629,261 | 1,102,362,362 | 2,998,129,882 |

**5. විගණන නිරීක්ෂණ**

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

ව්‍යාපෘතියේ අරමුණුවලට පරිබාහිර වූ දැයට කිරුළ ප්‍රදර්ශනයට මුද්‍රණය කරන ලද පොත් සඳහා දරන ලද රු.199,800 ක මුදලක් ව්‍යාපෘති වියදමක් වශයෙන් අයකර තිබුණි.

**5.2 නීති,රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම**

2014 අගෝස්තු 31 දිනැති අංක 353 (5) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට පටහැනිව, ව්‍යාපෘතිය විසින් කුලියට ගන්නා ලද මෝටර් රථ වෙනුවෙන් ධාවන සටහන් පිළියෙල කර නොතිබුණි.

**6. මූල්‍ය සහ භෞතික කාර්ය සාධනය**

**6.1 අරමුදල් උපයෝජනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ලබාගතහැකි වූ තොරතුරුවලට අනුව, සැපයීමට එකඟ වූ ණය ලැබීම්, අයවැය ගත ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුල අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වදගත් සංඛ්‍යා ලේඛන කීපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමෙන් එකඟ වූ මුදල | | 2013 සඳහා අයවැය ප්‍රතිපාදන | 2013 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ සමුච්චිත අරමුදල් | කාලපරිච්ඡේදය සඳහා උපයෝජන ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| ඊඩීසීඑෆ් | 35.37 | 3,980.38 | 1,004.62 | 1,004.62 | 2,445.09 | 100% |
| ශ්‍රී ලංරා | 15.14 | 1,704.62 | 86.76 | 75.68 | 116.15 | 87% |
| | 50.51 | 5,685.00 | 1,091.38 | 1,080.30 * | 2,561.24 * | |

* 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල් සහ රඳවා ගැනීම් ඇතුළත් නොවීම හේතුකොටගෙන මෙම වාර්තාවේ 4.1 ඡේදයෙහි දැක්වෙන සංඛ්‍යාවලට වඩා මෙම සංඛ්‍යා වෙනස් වේ.

**6.2 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විචලන ඇණවුම් 5ක් යටතේ රු.95,427,826 ක වූ මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතිය වැය කර ඇති නමුත්, එකී විචලන ඇණවුම් 2014 දෙසැම්බර් 31 වන තුරුත් ව්‍යාපෘති කළමනාකරු අනුමත කර නොතිබුණි.

(ආ) මාර්ග පුනරුත්ථාපන වැඩ කරගෙන යාමේදී හාරන පස් කොත්මලේ ඔය ඉවුරෙහි තැන්පත් කර තිබුණු අතර ඒ හේතුවෙන් ඉහළ කොත්මලේ ජලාශයේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශය බාදනයට ලක්වෙමින් පැවැති බව කරන ලද භෞතික පරීක්ෂණයකදී නිරීක්ෂණය විය. මෙවැනි පාරිසරික ගැටලු නියාමනය කිරීම සඳහා ව්‍යාපෘතිය පරිසර විශේෂඥයකු ශාස්තු සේවයේ යොදවා නොතිබුණි. කෙසේ වෙතත් ඉහත කරුණු සැලකිල්ලට නොගෙන මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර ආරක්ෂාව පිළිබඳ නිර්දේශ නිකුත් කර තිබුණි.

(ඇ) තලවකැලේ නගරයේ වෙළඳ සැල් හිමියන්ගේ විරෝධතා හේතුකොටගෙන, නාගරික ප්‍රදේශවල කිලෝමීටර් 88+200 සිට 88+400 දක්වා පදික මාරුවල මීටර් 1.5 ක් වූ ප්‍රමිත පළල මීටර් 0.4 දක්වා අඩුකිරීමට ව්‍යාපෘතිය තීරණය කරන ලදී.

(ඈ) කොන්ත්‍රාත්කරු විසින් වැඩ බිමෙහි වැඩ 2011 දෙසැම්බර් 01 දින ආරම්භ කළ නමුත් රදැල්ලෙහි අතුරු මාර්ගය කොත්මලේ උමඟ සහ නානුඔය පොලව යට මාර්ගය ඉදිකිරීමේ කටයුතු ප්‍රමාද සහිතව අරම්භ කර තිබුණි.

(ඉ) තව ද කණ්ඩායම් ප්‍රධානිගේ 2013 දෙසැම්බර් 05 දිනැති අංක පීඊඩී/එච්එන්ඊ/13-1069 දරන ලිපිය අනුව මාර්ග පුනරුත්ථාපන වැඩ ක්‍රමවත්ව කරගෙන යාම සහ තත්වපාලනය තවුරුකරගැනිම සඳහා කොන්ත්‍රාත්කරුගේ නියෝජිතයන්, තත්ව සහතික කළමණාකරු, ඉදිකිරීම් කළමනාකරු සහ ප්‍රධාන ඉන්ජිනේරු වැනි සුදුසුකම් ලත් පුද්ගලයන් කොන්ත්‍රාත්කරු විසින් සේවයේ යොදවා නොතිබුණි.

(ඊ) ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ 2013 පෙබරවාරි 13 දිනැති අංක ආර්ඩීඒ/එම්එෆ්පී/ඊඩීඑෆ්/cons දරන ලිපිය පරිදි මාර්ගයට ගල් ඇල්ලීමේ දී ද්‍රව්‍ය ඉන්ජිනේරුවරයකුගේ සේවය ලබා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. මාර්ග ප්‍රතිසංස්කරණයෙහි සාර්ථක භාවය රඳා පැවැත්ම සඳහා මාර්ග තැලීමේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් මෙම කාර්යය ඉතා වැදගත් වේ.